ih,u yulu wejrK
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# කතෝලික ධර්මය

**10 ශ්‍රේණිය** **කාලය පැය 3 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 මෙය දෙවියන් වහන්සේට තුති පිදීමේ මංගල්‍යයකි.
(1) පාස්කුව (2) නත්තල
(3) අහස් නැගී මංගල්‍යය (4) පෙන්තකොස්ත

02 පේදුරුතුමාගේ දේශනයෙන් බෞතීස්ම ස්නාපනය ලැබූ ගණන වන්නේ,
(1) 3000 කි. (2) 4000 කි. (3) 1500 කි. (4) 6000 කි.

03 ශුද්ධ වූ සභාවේ ප්‍රථම ප්‍රාණපරිත්‍යාගී වූ පුද්ගලයා ලෙස මොහුව හඳුන්වනු ලබයි.
(1) ශුද්ධ වූ පේදුරුතුමා (2) ශුද්ධ වූ ස්තේපන් තුමා
(3) ශුද්ධ වූ තාර්සීසියස් තුමා (4) ශුද්ධ වූ ජාකොබ් තුමා

04 ලූක්තුමාගේ වෘත්තිය කුමක් ද?
(1) ගුරුවරයෙක් (2) නීතිඥයෙක් (3) වෛද්‍යවරයෙක් (4) ව්‍යාපාරිකයෙක්

05 දේව අනාවරණයේ ලිඛිත මූලාශ්‍රය වන්නේ,
(1) ශුද්ධ වූ බයිබලය (2) ගීතිකාපොත
(3) පූජාපොත (4) කුරානය

06 අපෝස්තුළුවරුන්ගේ කාලයේ සිට පැවත එන ක්‍රිස්තියානි සභාව වන්නේ,
(1) මෙතෝදිස්ත සභාව (2) කතෝලික සභාව
(3) ඇංග්ලිකානු සභාව (4) වෙස්ලියානු සභාව

07 ප්‍රඥාව ඉල්ලූ දේව වචනය තුළ සඳහන් රජු නම් කරන්න.
(1) දාවිත් (2) සාවුල් (3) සලමොන් (4) සාමුවෙල්

08 ශුද්ධ වූ බයිබලය ග්‍රන්ථාරූඪ වූ කාල වකවානුව
(1) ක්‍රි.පූ. 900 - ක්‍රි.ව. 110 (2) ක්‍රි.පූ. 920 - ක්‍රි.ව. 100
(3) ක්‍රි.පූ. 650 - ක්‍රි.ව. 710 (4) ක්‍රි.පූ. 950 - ක්‍රි.ව. 100

09 සංකේත භාවිතයෙන් ලියා ඇති ග්‍රන්ථ 2 වන්නේ,
(1) උත්පත්ති, මතෙව් (2) නික්මයාම, කොරෙන්ති
(3) දානියෙල්, එළිදරව් (4) නික්මයාම, දානියෙල්

10 පාවුළු තුමා විසින් රචිත සංදේශ ගණන කීයද?
(1) 13 යි. (2) 8 යි. (3) 9 යි. (4) 12 යි.

11 ශුද්ධ වූ පාවුළු තුමා අධ්‍යාපනය ලැබුයේ මොහු යටතේ ය.
(1) තාර්සීසියස් (2) ගමාලියෙල් (3) දාවිත් (4) නබුකත්නසර්

12 ශුද්ධ වූ පාවුළුතුමා අයත් ගෝත්‍රය වන්නේ,
(1) ඊශ්‍රායෙල් (2) ජුදා (3) සමාරිය (4) බෙන්ජමින්

13 අන්‍ය ජාතීන්ගේ අපෝස්තුළුවරයා යන ගෞරව නාමය හිමිවන්නේ,

(1) පාවුළු තුමාට (2) දාවිත් තුමාට (3) බර්නබස් තුමාට (4) ජොහාන් තුමාට

14 පර්වතය යන්නෙහි තේරුම වන්නේ,

(1) සාවුල් (2) පාවුළු (3) පේදුරු (4) ඇන්ඩෘ

15 ජේසුතුමා ශුද්ධ වූ සභාවේ නායකත්වයට පත්කරන ලද්දේ කවුරුන්ව ද?

(1) මතෙව් තුමා (2) පේදුරු තුමා (3) මෝසෙස් තුමා (4) ආබ්‍රහම් තුමා

16 අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ඉපදුණු වර්ෂය වන්නේ,

(1) 1946 දී (2) 1956 දී (3) 1948 දී (4) 1936 දී

17 අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාව කාදිනල් තනතුරට ඔසවන ලද්දේ කවුරුන් විසින් ද?

(1) දෙවන ජුවාම් පාවුළු පාප් තුමා (2) 23 වෙනි ලියො පාප් තුමා

(3) 12 වන පියුස් පාප් තුමා (4) පළමුවන ප්‍රැන්සිස් පාප් තුමා

18 මෙතුමා කතෝලික සභාවේ කීවෙනි ශුද්ධෝත්තම පියතුමා ද?

(1) 265 (2) 264 (3) 266 (4) 267

19 ඒකත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(1) ශුද්ධ වූ සභාවේ සමානාත්තාවයයි. (2) ශුද්ධ වූ සභාවේ එකමුතුකමයි.

(3) ශුද්ධ වූ සභාවේ කඩිසරකමයි. (4) ශුද්ධ වූ සභාවේ එඩිතරකමයි.

20 අපෝස්තුළුවරයා යනු

(1) ශ්‍රාවකයාය (2) දේශකයාය

(3) උපදේශකයාය (4) යවනු ලැබූ තැනැත්තාය

21 ශුද්ධ වූ සභා ඉතිහාසය ප්‍රධාන යුග කීයකට බෙදා තිබේ ද?

(1) 5 යි. (2) 3 යි. (3) 4 යි. (4) 2 යි.

22 අනුරාධපුරයෙහි තිබී ගලක කෙටූ කුරුසිය හමුවූයේ කිනම් වර්ෂයේ ද?

(1) 1916 (2) 1910 (3) 1912 (4) 1918

23 පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණියේ කිනම් වර්ෂයක ද?

(1) 1508 (2) 1505 (3) 1515 (4) 1510

24 අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත රචනා වී ඇත්තේ කුමන ස්ථානයේ දී ද?

(1) ජුදයේ දී (2) බෙත්ලෙහෙමේ දී

(3) සිරියාවේ දී (4) අක්කායා දී

25 ශ්‍රී ලංකාවට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම ලෙස අප හඳුන්වනු ලබන්නේ,

(1) නිර්මල මරිය නිකාය (2) අගුස්තීනු නිකාය

(3) බෙනදිකානු නිකාය (4) ප්‍රැන්සිස්කානු නිකාය

26 ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවරයා ලෙස විරුදාවලිය ලැබුවේ,

(1) භාග්‍යවන්ත ජුසේවාස් පියතුමා (2) ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා

(3) මර්සලින් ජයකොඩි පියතුමා (4) මයිකල් රුදිගෝ පියතුමා

27 ජුසේවාස් පියතුමා උපන් වර්ෂය කුමක් ද?

(1) 1657 (2) 1654 (3) 1651 (4) 1650

The National e-Learning Portal for The General Education

28 දේශීය කිතුණු සාහිත්‍යයක් ගොඩනැගීමට මෙතුමා පුරෝගාමී වූයේය.

(1) ජුසේවාස් පියතුමා (2) ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා

(3) මර්සලින් ජයකොඩි පියතුමා (4) මයිකල් රුද්‍රිගෝ පියතුමා

29 2012 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ රදගුරු පදවි කීයක් තිබේ ද?

(1) 11 යි. (2) 10 යි. (3) 13 යි. (4) 12 යි.

30 දේව ප්‍රසාද නිධානයන්ගෙන් දේව ප්‍රසාද නිධානය නමින් හඳුන්වනු ලබන්නේ,

(1) ප්‍රසාද ස්නාපනය (2) සමගි සන්ධානය

(3) දිව්‍ය සත්ප්‍රසාදය (4) ආශිර්වාදකාර බන්ධනය

31 භාග්‍යවත් ජුසේවාස් පියතුමා ලක්දිවට පැමිණියේ කිනම් පීඩන අවධියකදී ද?

(1) පෘතුගීසී පීඩන අවධියේ දී ය. (2) ලන්දේසි පීඩන අවධියේ දී ය

(3) ඉංග්‍රීසි පීඩන අවධියේ දී ය. (4) බ්‍රිතාන්‍ය පීඩන අවධියේ දී ය

32 කතෝලිකයන් ශුද්ධ ලියවිල්ල අධ්‍යයනය කළ යුත්තේ,

(1) ලෝකය තුළ සභාවේ ක්‍රියාකාරීත්වය දැනගැනීමට ය.

(2) පුරාණ ගිවිසුමට වඩා නව ගිවිසුමට මුල්තැන දෙමින්ය.

(3) ශුද්ධ වූ සභාවේ මගපෙන්වීම යටතේ ය.

(4) මූලධර්මවාදීන්ට පිළිතුරු දීමටය.

33 මිනිස් සිරුර නිර්මාණය වී ඇත්තේ භෞමික මෙන්ම ...................... යන කොටස් දෙක එක්වීමෙනි. හිස්තැනට සුදුසු වචනය වන්නේ,

(1) ජීවමාන (2) ස්වාභාවික (3) ශාරීරික (4) අධ්‍යාත්මික

34 ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග කීයද?

(1) 7 යි. (2) 4 යි. (3) 5 යි. (4) 6 යි.

35 නොදවන පූජාවන් සඳහා භාවිතා කළ ද්‍රව්‍යයක් නොවන්නේ,

(1) පිටි (2) ධාන්‍ය (3) සීනි (4) තෙල්

36 ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුළු මුනිතුමා භාග්‍යවරයට ඔසවනු ලැබූ වර්ෂය වන්නේ,

(1) 2011 (2) 2007 (3) 2005 (4) 2010

37 ලෝකයේ විවිධ සංස්කෘතීන් සහ ජාතීන් වෙතට සුභ වදන ගෙනයාමේ ගෞරවය හිමිවන්නේ,

(1) ශුද්ධ වූ පේදුරු තුමාට(2) ශුද්ධ වූ ජුවාම් තුමාට

(3) සකල ලෝවාසීන්ට (4) ශුද්ධ වූ පාවුළු තුමාට

38 ''සත්‍ය'' නමින් ලිපියක් පලකළේ

(1) ප්‍රැන්සිස් සේවියර් මුනිතුමා (2) මැක්ෂිමිලියම් කෝල්බේ මුනිතුමා

(3) දෙවන ජුවාම් පාවුළු පාප්තුමා (4) ශුද්ධ වූ අන්තෝනි මුනිතුමා

39 මයිකල් රුද්‍රිගෝ පියතුමා ඉපදුන වර්ෂය වන්නේ,

(1) 1937 (2) 1947 (3) 1927 (4) 1957

40 ශුද්ධ වූ බයිබලයේ මූලික අරමුණ වන්නේ,

(1) දේව රාජ්‍යය විස්තර කිරීමය (2) දේව සංරක්ෂණය පෙන්වාදීමය

(3) ගිවිසුම් ජීවිතය හඳුන්වාදීමය (4) ඊශ්‍රායෙල් ඉතිහාසය ඉදිරිපත් කිරීමය

The National e-Learning Portal for The General Education

## II - කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. ඉතිරි ප්‍රශ්නවලින් ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 (1) පාස්කු අභිරහස යනු කුමක් ද?

(2) ප්‍රඥා සාහිත්‍ය අයත් ග්‍රන්ථ 2 ක් නම් කරන්න.

(3) මුල් කිතුණු සභාවේ ලක්ෂණ 2 ක් නම් කරන්න.

(4) ජේසුස්වහන්සේ පේදුරුතුමාට පැවරූ තුන්ප්‍රකාර කාර්යයන් මොනවා ද?

(5) ශුද්ධ වූ සභාව තුළ පැවතිය යුතු අනිවාර්යය ලක්ෂණ 2 ක් නම් කරන්න.

(6) නෙස්ටෝරියන් කුරුසිය සොයාගනු ලැබුයේ කිනම් වර්ෂයක ද?

(7) භාග්‍යවත් ජුසේවාස් පියතුමා කළ ප්‍රාතිහාර්යයන් 2 ක් නම් කරන්න.

(8) බ්‍රිතාන්‍ය යුගය තුළ මෙරට සේවය සඳහා පැමිණි ධර්මදූත නිකායයන් 3 ක් නම් කරන්න.

(9) දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ 3 ක් නම් කරන්න.

(10) දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් 3 ක් සඳහන් කරන්න.

02 (1) පෙන්තකොස්ත යන වචනයේ අර්ථය ලියන්න.

(2) මුල් කිතුණු සභාවේ ලක්ෂණ ලියාදක්වන්න.

(3) ශුද්ධාත්ම බලය ලැබූ ඔබ විශ්වාසය වෙනුවෙන් සාක්ෂි දැරූ අවස්ථාවක් ලියන්න.

03 (1) ශුද්ධ වූ පාවුළුතුමා ගැන වචන 75 ක පමණ රචනාවක් ලියන්න.

(2) ශ්‍රී ලංකා දහම් සේවයේ නියුතු විශ්වාසයන්ට ශුද්ධ වූ පාවුළු තුමාගෙන් ලබාගත හැකි ආදර්ශ 3 ක් ලියන්න.

(3) ඔබගේ ජීවිතයේ අභියෝග ජයගත් අවස්ථා 3 ක් ලියන්න.

04 (1) ශුද්ධ වූ සභාව යනු කුමක් ද?

(2) ශුද්ධ වූ සභාවේ ලක්ෂණ ලියා එක් එක් ලක්ෂණය වෙන වෙනම කෙටියෙන් හඳුන්වන්න.

(3) ශුද්ධ වූ සභාවේ සාමාජිකයකු ලෙස ශුද්ධවන්ත ජීවිතයක් ගතකිරීමට ඔබට ලැබී ඇති කැඳවීම අනුව ඔබ කළ යුතු කාර්යයන් 3 ක් ලියන්න.

05 (1) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ යන ප්‍රසාද නිධානය හඳුන්වන්න.

(2) දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ හතරක් දක්වන්න.

(3) දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට පංගුකාරවන්නකු තුළ තිබිය යුතු යහපත් ගුණාංග 4 ක් දක්වන්න.

06 (1) පාස්කු මංගල්‍යය හඳුන්වන්න.

(2) යුදා පාස්කු භෝජනයේ මූලිකාංග හතර නම් කරන්න.

(3) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට අවශ්‍ය ආත්මික හා ශාරීරික සූදානම විස්තර කරන්න.

07 මින් ඔබ කැමැති පුද්ගලයන් දෙදෙනෙකු ගැන කෙටියෙන් හඳුන්වන්න.

(1) ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුළු මුනිතුමා

(2) භාග්‍යවත් තෙරේසා මව්තුමිය

(3) භාග්‍යවත් ජුසේවාස් පියතුමා

(4) ගෞරවනීය ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා